An Anthology of Trilingual Poetry

# pulse

Edited by Sabreena Niles

Centre for Gender Studies
University of Kelaniya



## කුවේණියට ලියපු කවි

වැල්ලේ සැතපී
තඹවන් වූ ගත
දැක්කේ ඇයි නුඹ
මුඩුහිස වෙනුවට

වෙළඹක වී තව
පිට දුන්නේ කිම
බැල්ලක වී නුඹ
නො සපා උගෙ අත

හත් සියයක් උන්
සැඟ වූ විල තුළ
ඉඩ මදි වී දෝ
ඌ සඟවන්නට

කපු කැටුවත් නුඹ
ඌ සරසන්නට
ඒ කපු මදි උගෙ
හෙළුව වහන්නට

අනුර මනතුංග

Previously published in
Kuvenita Liyapu Kavi : Author Publication : 2006

## දෝන කැතරිනා

උරුමයක් තිබුණත්
රජකමට
රැජිනක් නොවුණාය
ඇය
කිසිදාක

බිසවක් උනා ඇය
රජෙකුට
රජකමට උරුමයක්
නොතිබුණ

මියගියත් ඒ රජ
රැජිනක් නොවුණාය
ඇය
බිසවක් උනා මිස
තව'කෙකුට
උරුමයක් වන්නට
රජකම උඟට.

අනුර මනතුංග

Previously published in
Narakesak Dutu Asin: Author Publication: 2009